**මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව - 2021**

**---------------------------------------------------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේවිධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී,වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේ ද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේ දී, මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් රු.380,960 ක ඉඩමක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර, ඉඩම් දෙකක හා ගොඩනැගිල්ලක වටිනාකම තක්සේරු කර හෝ ගිණුම්ගත කර හෝ නොතිබුණි. | ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කළ යුතුය |
| (ආ) | ඉකුත් වර්ෂයේ දී ක්‍රීඩාංගණයක් සංවර්ධනය කිරීම සඳහා දරා තිබුණු රු.960,529 ක පිරිවැයමූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | ප්‍රාග්ධන වියදම් නිවැරදිව ගිණුම් ගත යුතුය |
| (ඇ) | සභාවට අයත්රු.6,390,000 කකැබ් රථය සමාලෝචිත වර්ෂයේ දී, මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ගිණුමට තොරතුරු ලබා දීමේ දී අතපසු වීමකින් සටහන් කිරීමට නොහැකි වී ඇත. ඉදිරියේ දි සටහන් කරන බව | රථ වාහනවල පිරිවැය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඈ) | සමාලෝචිත වර්ෂයඅවසානයට පැවති රු.297,911 ක පුස්තකාල පොත්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරියේ දී පැහැදිලි කිරීමක් ඉදිරිපත් කරන බව | පුස්තකාල පොත්වල නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු ආදායම රු.429,488 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | රු.372,731 ක් දෝෂ සහිතව ඇතුළත්ව තිබූ ශේෂ නිවැරදි කිරීමක් බවත්, රු.57,867 ක වෙනස 2022 වර්ෂයේ දි නිවැරදි කරන බව | වරිපනම් බදු ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසානයට කසළ බදු ආදායම රු.167,850 ක් අඩුවෙන්මූල්‍යප්‍රකාශනවල දක්වාතිබුණි. | 2022 වර්ෂයේ දී ජ'නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | කසළ බදු ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු සේවක ණය ශේෂය රු.230,480 ක් වැඩියෙන්මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අවසන් ගිණුම සඳහා ලබා දෙන ලද මුද්‍රිත උපලේඛනයේ වැරදි දත්ත සටහන් වී ඇති බව හා දැනට නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව | සේවක ණය ශේෂ නිවැරදිව හඳුනා ගෙන ගිණුම් තැබිය යුතුය |

1.6.2 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 05 කට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂහා උපලේඛනවල ශේෂ අතර රු.12,119,019 ක වෙනසක් පැවතුණි. | ශේෂ නිවැරදි කර ගැනීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර, ඒ අනුව කටයුතු කරමි | නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතුය |

1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂ පත්‍රයේ දක්වා තිබුණු රු.7,049,296 ක වත්කම් විෂයයන් 02 ක් සහ රු.2,725,738 ක බැරකම් විෂයයන් 03 ක් වත්කම් ලේඛන, ලේඛන, උපලේඛන හා ශේෂ සනාථන ඉදිරිපත් නොකිරීම නිසා, විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | වත්කම් සමීක්ෂණ කටයුතු අවසන් වී ඇති අතර, ඉදිරියේ දි ලේඛනවලට ඇතුළත් කරමි | මූල්‍ය ප්‍රකාශනවල ශේෂ සඳහා වූ සාක්ෂි පිළියෙල කර ගත යුතුය |

1.7 අනුකූල නොවීම්

-------------------

නීති,රීති හා රෙගුලාසි ආදියටඅනුකූල නොවීම්

---------------------------------------------------

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ------------------------ | ------------------ | ---------------- | ------------- |
| | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>--------------------------- | | | |
| i | මුදල් රෙගුලාසි 571 හා 571(ඇ) | රු.6,443,631 ක කල් ඉකුත් වූ කර්මාන්ත තැන්පතු, මිශ්‍ර තැන්පත් හා වෙනත් තැන්පතු 155 ක් මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායමට ගෙන නොතිබුණි. | කොරෝනා රෝගී තත්ත්වය හේතුවෙන්, නියමිත දිනට වැඩ නිම කර ගැනීමට නොහැකි වූ බවත්, හැකිතාක් කර්මාන්ත ඉටු කළ බව හා ඉටු කිරීමට නොහැකි වූ කර්මාන්ත අවලංගු කරන බව | තැන්පතු ශේෂ සම්බන්ධව මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය |
| ii | මුදල් රෙගුලාසි 371(ඇ) | මාණ්ඩලික තත්ත්වයේ නොවන නිලධාරීන්ට අවස්ථා 30 කදී රු.765,200 කඅතුරු අග්‍රිම ලබා දී තිබුණි. | මාණ්ඩලික නිලධාරී වශයෙන් ලේකම් පමණක් සිටින බැවින්, ලේකම්ගේ අධීක්ෂණය යටතේ විෂයය නිලධාරීන් වෙත අත්තිකාරම් ලබා දීම සිදු කර ඇති බව | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය |

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,020,107 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.93,823,908 ක්විය.

2.2 ආදායම් පරිපාලනය

------------------------

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-------------------------------------

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණපහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) වරිපනම් | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි වරිපනම් බදු ආදායම රු.18,720,121 ක් අය කර නොතිබුණු අතර, එම ශේෂය තුළ ඒකකයක හිඟය රු.5,000 ට වැඩි ඒකක 364 කින් අය විය යුතු රු.3,842,241 ක් ඇතුළත්ව තිබුණි. | 2022 වර්ෂයේ ගෙයින් ගෙට ගොස් වරිපනම් බදු අය කිරීමේ වැඩසටහනක් පැවැත්වීම තුළින් හිඟ අය කර ගැනීමේ කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරන බව | හිඟ වරිපනම් බදු අය කර ගත යුතුය |
| (ආ) කුලී | | |
| වෙළඳ අයිතිය බදු දීම | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට සභාවට අයත් හෙළ බොජුන් හළ බදු දීම වෙනුවෙන් අය විය යුතු රු.576,000 කඅය වීම හිඟ හිට පැවති අතර, ඒ සඳහා වූ ප්‍රමාද ගාස්තු සියයට 10 ක මුදල ද අය කර නොතිබුණි. | මහා සභා තීරණ අනුව කොටසක් කපා හැර ඇති බවත්, ඉතිරි මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ඇ) බලපත්‍ර ගාස්තු | | |
| වෙළඳ බලපත්‍ර | | |
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ අංක 149 වන රීතිය අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර පිළිබඳව සමීක්ෂණයක් සිදු කර නොතිබුණු අතර, වර්ෂය අවසානයට වෙළඳ ව්‍යාපාර 323 කින් අය විය යුතු රු.435,750 ක් අය කර නොතිබුණි. | වර්තමානය වන විට කොටසක් අය කර ඇති අතර, ඉතිරි මුදල් අය කිරීමට කටයුතු කරමි | සමීක්ෂණ කටයුතු සිදු කර හිඟ ආදායම් අය කළ යුතුය |
| (ඈ) වෙනත් ආදායම් | | |
| ත්‍රිරෝද රථ ගාස්තු | | |
| සමාලෝචිත වර්ෂය සඳහා ත්‍රිරෝද රථ පිළිබඳ සමීක්ෂණයක් සිදු කර නොතිබුණු අතර, 2019 වර්ෂයේ සමීක්ෂණය අනුව, බිල් කර තිබුණු ත්‍රිරෝද රථ 102 කට අදාළව රු.122,400 ක බලපත්‍රගාස්තු අය කර නොතිබුණි. | සමීක්ෂණයක් සිදු කර ඉදිරි කටයුතු සිදු කරන බව | සමීක්ෂණ කටයුතු සිදු කිරීමට හා හිඟ බලපත්‍ර ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුය |

(ඉ) සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල්

--------------------------------------------

| | | |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය අනුව, සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල්වල ආදායමෙන් ප්‍රතිශතයක් බලපත්‍ර ගාස්තුවක් ලෙස අය කළ යුතු වුව ද, බල ප්‍රදේශයේ හෝටලයකින් 2019/2020 වර්ෂය සඳහා අය විය යුතු රු.2,355,518 ක මුදල අය කර නොතිබුණු අතර, 2020/2021 වර්ෂවලට අදාළ ගිණුම් වාර්තා ද ලබා ගෙන හෝ අය කළ යුතු ආදායම ගණනය කර හෝ නොතිබුණි. | ගාස්තු ගණනය කර ගෙවන ලෙස හෝටල් හිමියන් වෙත දන්වා යවා ඇති බව | හිඟ බලපත්‍ර ගාස්තු අය කිරීම හා බිල් නොකළ ආදායම් හඳුනා ගෙන බිල් කළ යුතුය |

(ඊ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

----------------------------

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.543,580 ක් හා මුද්දර ගාස්තු රු.42,730,579 ක් අය කර නොතිබුණි. | උසාවි දඩ හිඟ මුදල් ලැබී ඇති බව හා මුද්දර ගාස්තු ඉදිරියේ දී අය කර ගැනීමට කටයුතු කරමි | උසාවි දඩ හා මුද්දර ගාස්තු අය කර ගත යුතුය |

2.3 අධිභාර

----------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂය තුළ දී රු.262,608 ක වටිනාකමට අධිභාරයක් පනවා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානයට එම මුදල් අය කර නොතිබුණි. | අදාළ මන්ත්‍රීවරුන්ට මෙම මුදල ගෙවන ලෙස දන්වා ලිපි යවා ඇතත්, මෙතෙක් කිසිදු මුදලක් ගෙවා නැති බව | අධිභාර සහතික අනුව අය කිරීම් සිදු කළ යුතුය |

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයඅවසානයට වසර 05 ක කාලයක් ඉක්මවා තිබුණුඑකතුව රු.50,678,259 කලැබිය යුතු ශේෂ අය කර නොතිබුණි. | හිඟ ආදායම් අය කිරීමට කටයුතු කරන බව | ලැබිය යුතු ගිණුම් ශේෂ අය කර ගත යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයඅවසානයට වසර 05 ක කාලයක් ඉක්මවා තිබුණුඑකතුව රු.3,741,398 කගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කළ යුතුය |

3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ අතුරු බෙදීම් සිදු කළ ඉඩම්වලින් ප්‍රජා, විනෝද කටයුතු සහ එළිමහන් ප්‍රදේශ වශයෙන් භාවිතා කිරීම සඳහා ලබා ගෙන තිබුණු ඉඩම් කොටස් 19 ක් අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය නොකර නිෂ්කාර්යයව පැවතුණි. | දැනට වැට මායිම් ගැසීමේ කටයුතු සිදු වෙමින් පවතින බව | සභාවට ලැබී ඇති ඉඩම් කොටස් පොදු කටයුතු සඳහා සංරක්ෂණය කර භාවිතා කළ යුතුය |

3.3 භාණ්ඩ සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයට අදාළව පුස්තකාල 05 ක සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයේ දී, හඳුනා ගත් රු.74,767 ක වටිනා පොත් 265 ක ඌනතාවය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර, වෙන්දේසි කර විකිණීමට නිර්දේශ කර තිබුණු භාණ්ඩ සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද වෙන්දේසියේ විකුණා නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ප්‍රමාද වූ බවත්, මේ වන විට අවශ්‍ය කටයුතු අවසන් අදියරේ පවතින බව | ඌනතා සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම හා වෙන්දේසි කටයුතු ද අවසන් කළ යුතුය |

3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ සභාව විසින් ඉටු කරන ලද කර්මාන්ත 03 කට අදාළ ගෙවීම් බිල්පත් අනුව ඉටු නොකළ වැඩ සඳහා රු.222,433 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. | එක් කර්මාන්තයක ඉටු නොකළ වැඩ දැනට ඉටු කර ඇති බව හා අනෙක් කර්මාන්ත 02 හි වැඩ අවසන් කළ පසු පිළිතුරු ලබා දෙන බව දන්වා ඇත | ඉටු කළ වැඩ සඳහා පමණක් ගෙවීම් සිදු කළ යුතු අතර, වැඩිපුර ගෙවීමට වගකිව යුතු නිලධාරීන් හඳුනා ගෙන ක්‍රියාමාර්ග ගත යුතුය |

3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත කාර්යය මණ්ඩලයේ තනතුරු 06 ක පැවති පුරප්පාඩු 08 ක් සම්පූර්ණ කර නොතිබුණි. | මේ වන විට කළමනාකරණ සේවා නිලධාරී පුරප්පාඩු 02 ක් සම්පූර්ණ වී ඇති බව | අත්‍යවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය |